දිවයින

# පළාත් සභා 3 ක ඡන්දයට ඉදිරි සති දෙක තීරණාත්මකයි

රනිල් ධර්මසේන

ඉදිරි සති දෙක ඇතුළත 20 වැනි සංශෝධනය සම්බන්ධයෙන් ආණ්ඩුව නෛතික ක්‍රියාමාර්ග නොගතහොත් සබරගමුව, උතුරුමැද හා නැගෙනහිර පළාත් සභා මැතිවරණය පැවැත්වීමට අදාළ පියවර ගැනීමට මැතිවරණ කොමිසමට බලය පැවරෙන බව පැෆ්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පැවසීය.

ජනමත විචාරණයකින් තොරව පළාත් සභා නිල කාලය වසර 05 කට වඩා දීර්ඝ කිරීමට නොහැකි යැයිද මේ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ කරුණු දැක්වීමට තම සංවිධානය සූදානමින් සිටින බවද ඊයේ (22 දා) කොළඹ පැවැති මාර්තු 12 ව්‍යාපාරයේ මාධ්‍ය හමුවේදී ඒa මහතා පැවසීය.

පළාත් පාලන නව මැතිවරණ ක්‍රමය අනුව මනාප ක්‍රමය අහෝසි වී ඇති නිසා හොඳ අපේක්ෂකයන් තේරීම දේශපාලන පක්ෂවල වගකීමක් බවද මේ නිසා තම පක්ෂවල අපේක්ෂකයන් තේරීමේ ක්‍රමවේදය වහා රටට හෙළි කරන ලෙසද ඒ මහතා දේශපාලන පක්ෂවලින් ඉල්ලා සිටියේය.

මැතිවරණ කල් දැමීමට ආණ්ඩුව ගත් පියවර පිළිබඳව මාර්තු 12 ව්‍යාපාරය අප්‍රසාදය පළ කරන බවද ලබන 24දා පළාත් පාලන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසුව විරෝධතා මතු කිරීමෙන් තොරව සම්මත කර ගැනීම සියලු දේශපාලන පක්ෂවල වගකීමක් බවද ඒ මහතා පැවසීය. එමෙන්ම සියලු පක්ෂවලට එකඟ විය හැකි පරිදි සංශෝධන ඉදිරිපත් කිරීම ආණ්ඩුවේ වගකීමක් යැයිද හෙට්ටිආරච්චි මහතා කීය.